# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. ප්‍රධාන ගණකාධිකාරී (Chief Accountant)

**වැටුප් කාණ්ඩය** : HM 1-1 (ජ්‍යෙෂ්ඨ කළමනාකාර)

**සුදුසුකම්** : (පහත සඳහන් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණය, කළමනාකරණය, මූල්‍ය, වාණිජවේදී, ක්ෂේත්‍රයන්ට අදාලව උපාධියක්

   සමග

   අදාළ ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ" මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

   සහ

   රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ" මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**වැටුප** : HM 1-1-2016 - රු. 80,295 - 15X2,270 - 114,345/-

**සෙසු දීමනා** : ජීවන වියදම් දීමනාව, වෘත්තීය දීමනාව, පැමිණීමේ දිරි දීමනාව හා අනුමත වෙනත් දීමනා, ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ට හිමි ප්‍රවාහන හා ඉන්ධන දීමනා, වෛද්‍ය රක්ෂණ පහසුකම් සහ වෙනත් ප්‍රතිලාභ.

## 2. අභ්‍යන්තර විගණක (Internal Auditor)

**වැටුප් කාණ්ඩය** : MM 1-1 (කළමනාකාර)

**සුදුසුකම්** : පහත සඳහන් සුදුසුකම් වලින් එකක් ලබා ගැනීමෙන් අනතුරුව විගණනය පිළිබඳව රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද ලබා තිබීම.

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය හෝ වාණිජ්‍ය පිළිබඳ ලබාගත් උපාධිය.

හෝ

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

හෝ

(ඇ) එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

හෝ

(ඈ) සහතිකලත් ඒකාබද්ධ ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) මධ්‍යම පරීක්ෂණය සමත්වීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය** : MM 1-1-2016 - රු. 53,175 - 10X1,375 - 15X1,910-95,575/- (වැටුපට අමතරව අනුමත සෙසු දීමනා හා පහසුකම් හිමිවේ.)

## 3. පොත් තබන්නා (Book Keeper)

**වැටුප් කාණ්ඩය** : MA 2-2 (කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන)

**සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වියයුතු අතර, (උසස් පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂය ධාරාවෙන් හෝ ගිණුම්කරණය ඇතුළත්ව පොදු විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

සහ

ගිණුම්කරණ ක්ෂේත්‍රයට අදාළ වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

**වයස** : අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතුය.

**වැටුප් පරිමාණය** : MA2-2, 2016 - රු.30,310- 300X10-350X07-600X04-710X20-52,360/-

**පොදු** : (වැටුපට අමතරව අනුමත සෙසු දීමනා හා පහසුකම් හිමිවේ.)

මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාර අරමුදල් හිමිකම් සහිත ස්ථිර තනතුරු වේ. අයදුම්කරුවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් සහිත අයදුම්කරුවන් බඳවාගනු ලැබේ. අයදුම්පත් 2023.06.22 දිනට පෙර තනතුරේ නම සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ rupavahinidg@gmail.com යන විද්‍යුත් ලිපිනයට හෝ එවිය යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.**
**දුරකථන අංකය: 011-2698187 වෙබ් අඩවිය :** www.rupavahini.lk
2023.06.06